## කොළඹ විශ්වවිද්‍යාලය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - රාජගිරිය
## 05 වන බී. ඒ. එම්. එස්. වාර්ෂික පරීක්ෂණය - 2015 පෙබරවාරි
## දේශීය චිකිත්සා

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. කාලය - පැය 03

පෙ. ව. 9.00 - මධ්‍යාහ්න 12.00

පිළිතුරු ලිවීමේදි සෑම කොටසක් සඳහාම වෙන වෙනම පිළිතුරු ලිවීමේ පොතක් භාවිතා කරන්න.

### I කොටස (පෝදු)

01 i පාරම්පරික වාත රෝග වෙදකමෙහි වාත රෝග ප්‍රභේදකරණය උදාහරණ සහිතව දක්වන්න.

(ලකුණු 06)

ii වාත වේදනා ශමනය සඳහා දේශීය චිකිත්සාවේ යෙදිය හැකි අරිෂ්ට, ගුලි, කල්ක, චූර්ණ 02 බැගින් මාත්‍රා සහිතව සඳහන් කරන්න.

(ලකුණු 04)

iii අංශභාග රෝගය සඳහා චිකිත්සා පද්ධතියක් වට්ටෝරු සහිතව විස්තර කරන්න.

(ලකුණු 10)

02 i දේශීය චිකිත්සාවේ සඳහන් පිනස් රෝගයේ පොදු හේතු සඳහන් කරන්න. (ලකුණු 06)

ii පිනස් රෝග ලක්ෂණ විස්තර කරන්න.

(ලකුණු 06)

iii පිනස් රෝගය සඳහා යෙදිය හැකි කෂාය, හිසගැල්ලුම්, නස්‍ය සහ දුම් බෙහෙත් 02 බැගින් වට්ටෝරු සහිතව දක්වන්න.

(ලකුණු 08)

### II කොටස (සර්ප විෂ)

03 i කුණකටු දෂ්ඨයක් ඇති වූ විට රෝගියාගේ පහළවන රෝග ලක්ෂණ දක්වා එම විෂට යොදන ප්‍රතිකාර සඳහන් කරන්න.

(ලකුණු 06)

ii සර්ප දෂ්ඨයක් වූ අවස්ථාවක රෝගියා මල නොමල බව හඳුන්ගන්නේ කෙසේද?(ලකුණු04)

iii හොස්සට කියනා නම දැන ගත් තේ<br>
පස්සට ඒ කේ. සම්පොතු ගත් තේ<br>
කහ ලූනු ලා මලවා අරගත් තේ<br>
පොලොං විෂට ගෙන දවටා පත් තේ

මෙම කවියේ අදහස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

අනිත් පිටුව බලන්න.

iv අර්ථය සගවා ඇති පහත සඳහන් ඖෂධ මොනවාද ?

(අ) දොරකඩ මිදුලේ තැනූ ගසේයා

(ආ) තන අල්ලා තෙල් ගනිමින

(ඇ) නුවරඑළියා

(ඈ) බුද්දංසරණ

(ඉ) විදුරඹ (ලකුණු 05

## III කොටස (දැවුම් පිළිස්සුම්)

04 i ඇසක් පිළිස්සීමට ලක්වූවිට (කුමන දෙයකින් හෝ) එම ඇස සුවය ලබන තුරු රෝගියාට ඔබ ප්‍රතිකාර කරන අයුරු සඳහන් කරන්න. (ලකුණු 12

ii ඇසක් පිළිස්සීමට ලක්වූ අයෙකුට වෙනත් ප්‍රතිකාර කර දින කිපයක් ගතවූ පසු ප්‍රතිකාර කරන ආකාරය පැහැදිලිව ලියා දක්වන්න. (ලකුණු 08

## IV කොටස (අක්‍ෂි රෝග)

05 i නුවන් පිළිකා රෝගය ඇසේ කුමන ස්ථානයක ඇතිවේද ? (ලකුණු 02

ii එම රෝගයේ රෝග ලක්‍ෂණ දක්වන්න. (ලකුණු 03

iii මෙම රෝගය සඳහා පියවරෙන් පියවර යොදන ප්‍රතිකාර පද්ධතියක් සඳහන් කරන්න. (ලකුණු 15

**2015. 04. 29**